සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 06 - 2023

## කතෝලික ධර්මය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 10 තෙක් නිවැරදි පිළිතුර තෝරා එම පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. ශුද්ධ බයිබලයේ අවසාන පොත වන්නේ,
    1. උත්පත්ති
    2. ගීතාවලිය
    3. එළිදරව්ව
    4. ශු. මතෙව් සුවිශේෂය

02. දෙවියන් වහන්සේ හා ඊශ්‍රායෙල් ජනයා අතර වූ ගිවිසුම වන්නේ,
    1. නික්මයාමයි.
    2. සීනයි
    3. ප්‍රේමයේ
    4. නව ගිවිසුමයි.

03. ජොහාන් ශුභාරංචියේ සංකේතය වන්නේ,
    1. ගවයා
    2. සිංහයා
    3. රාජාලියා
    4. මිනිසා

04. මැවීමේ කතාව සඳහන් වන්නේ,
    1. උත්පත්ති පොතේය.
    2. නික්මයාම පොතේ
    3. ගීතාවලියේ
    4. ගණන් කතාවේ

05. දෙවි පියා ඒදන් උයනේ පදිංචි කළේ,
    1. මරියතුමි හා ජුසේ තුමාව
    2. කායින් හා ආබෙල්ව
    3. ආදම් හා සාරාව
    4. ආදම් හා ඒවව

06. දේව මැවිල්ල සම්පූර්ණ වුයේ,
    1. මිනිසා මැවීමෙනි.
    2. ඉර හඳ මැවීමෙනි.
    3. අහස හා ජලය මැවීමෙනි.
    4. ගහකොළ මැවීමෙනි.

07. ''විපුල ප්‍රසාදලත් උත්තමිය, ඔබට මංගල වේ'' යන ප්‍රකාශය කළේ,
    1. ජේසුස් වහන්සේය.
    2. ගාබ්‍රියෙල් දේවදූතයාය.
    3. මෝසෙස්ය.
    4. රූෆායෙල් දේවදූතයාය.

08. මරියතුමියගේ ඥාතිවරියකි.
    1. සාරා
    2. මාර්තා
    3. සලෝමි
    4. එළිසබෙත්

09. ජේසුතුමාගේ දෙමව්පියෝ අවුරුදු පතා ජෙරුසලමට යනු ලැබුවේ,
    1. ජන සංගණනයටය.
    2. නම් තැබීමටය.
    3. පාස්කු සැමරීමටය.
    4. පවිත්‍ර වීමේ පිළිවෙතටය.

10. පරිණත කිතුණුවෙකු ලෙස ඔබව ආලේප කරන්නේ,
    1. ප්‍රසාද ස්නාපනයේ දී
    2. අභිවෘද්ධි ආලේපයේ දී
    3. පූජකවරයේදි
    4. දිව්‍ය සත්ප්‍රසාදයේ දී

(ලකුණු 20)

- **අංක 11 සිට 15 දක්වා නිවැරදි වාක්‍යයට ( √ ) ලකුණ ද, වැරදි වාක්‍යයට (× ) ලකුණ ද යොදන්න.**

11. කේලාම් කීම හයවන දේව පණතට විරුද්ධ පාපයකි. ( )
12. පූජකවරය ස්ථාපිත කළේ මහා බ්‍රහස්පතින්දා දිනදීය. ( )
13. ලෙවී ව්‍යවස්ථාව පංච පුස්තකයට අයත් පොතකි. ( )
14. මිනිසා එදිනෙදා ජීවිතය පවත්වා ගෙන යාමට අවශ්‍ය දෑ දේව මැවිල්ල තුළ ඇත. ( )
15. සබත් දිනයේ විනෝද ගමන් යා හැකිය. ( )

(ලකුණු 10)

- **අංක 16 සිට 20 තෙක් ප්‍රශ්න සඳහා හිස්තැනට ගැලපෙන පිළිතුරු තෝරා ලියන්න.**

16. නික්මයාම පොතේ ප්‍රධාන චරිතය .............................................. තුමාය.
17. ...................................................... තුමා සතුරන්ටත් ප්‍රේම කළ යුතු බව ජීවිතාදර්ශයෙන් පෙන්වූවේය.
18. වර්තමානයේ පව් කමා කිරීමේ බලය ඇත්තේ ...............................................................ය.
19. යාච්ඤාවේ දිවි පෙවෙතක් ගත කිරීමෙන් අපට ....................................................... වර්ධනය විය හැකිය.
20. අසල්වැසියාට ........................................................ කිතු දහමේ මූලික හරයයි.

( පූජාප්‍රසාදිතුමන්ලාට/ ආධ්‍යාත්මිකව/ මෝසෙස්/ ස්තේපන්/ ප්‍රේම කිරීම )

(ලකුණු 10)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.**

01. i. පැරණි ගිවිසුමේ හා නව ගිවිසුමේ පොත් ගණන පිළිවෙලින් ලියන්න.

ii. පංච පුස්තකය හඳුන්වන වෙනත් නම් 02 ක් ලියන්න.

iii. ලූක් තුමා දක්ෂතා දැක්වූ විෂයය ක්ෂේත්‍ර 02ක් නම් කරන්න.

iv. මැවීමේ පළමු දින දෙවි පියා මැවූ දේවල් 02 ක් ලියන්න.

v. බිළිඳු ජේසු කුමරුන් බැහැදැකීමට පැමිණි පුද්ගල කණ්ඩායම් දෙකක් නම් කරන්න.

vi. සුවදානයේ ප්‍රසාද නිධාන දෙක නම් කරන්න.

vii. අනිවාර්යයෙන්ම දිව්‍ය පූජාවට සහභාගි විය යුතු දින 02 නම් කරන්න.

viii. දිව්‍ය සත්ප්‍රසාදය ස්ථාපිත කළේ කවදාද? කුමන අවස්ථාවේද?

ix. ශුභාරංචි රචනා කළ අපෝස්තුළුවරුන් දෙදෙනා නම් කරන්න.

x. මැවීමේ කතාව අනුව මිනිසාගේ දැකිය හැකි විශේෂ ලක්ෂණ 02 ක් නම් කරන්න.

( 2 x 10 = 20 )

02. i. අසල්වැසියාට ප්‍රේමය දැක්වීමට උගන්වන දේව පනත් 02 ක් නම් කරන්න. (ල. 02)

ii. පාස්කු අභිරහස යනු කුමක්ද? (ල. 03)

iii. ඔබට පීඩා කරන්නන් හට දෙවි පියාණන්ගේ ආශිර්වාදය ලැබෙන ලෙසත් ඔවුන්ගේ සිත් අන් අය කෙරේ ප්‍රේමය දැක්වීමට යොමු කරවන ලෙසත් ඉල්ලා යාච්ඤාවක් නිර්මාණය කරන්න. (ල. 05)

03. i. ශ්‍රී ලංකාවේ කතෝලිකයන්ට නියම වන ණය මංගල්‍යයන් 02 ක් දිනය සහිතව නම් කරන්න. (ල. 02)

ii. දෙවි පියාණන්ට අපගේ ප්‍රේමය දැක්වීමට පිළිපැදිය යුතු දේව පනත් 03 නම් ලියන්න. (ල. 03)

iii. සබත් දිනය ශුද්ධවත්ව ගත කිරීම සඳහා කළ හැකි කාර්යයන් 05 ක් ලියන්න. (ල. 05)

04. i. රෝගීන්ගේ ආලේපය ලැබිය හැකි අවස්ථා 02 ක් ලියන්න. (ල. 02)

ii. සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානයෙන් ලැබෙන වරප්‍රසාද 03 ක් ලියන්න. (ල. 03)

iii. රෝගී වූ අයෙක් වෙනුවෙන් ඔබට කළ හැකි දේවල් 05 ක් ලියන්න. (ල. 05)

05. i. පෙන්තකොස්ත දිනයේ ශුද්ධාත්මයානන්ගෙන් පෝෂණය වූ අපෝස්තුළුවරුන් ලැබූ හැකියා 02 ක් නම් කරන්න. (ල. 02)

ii. ජීවිතයේ එක්වරක් පමණක් ලැබිය හැකි ප්‍රසාද නිධාන නම් කරන්න. (ල. 03)

iii. ප්‍රසාද ස්නාපනයෙන් ඔබට ලැබෙන වරප්‍රසාද 05 ක් ලියන්න. (ල. 05)

06. i. දෙවි පියා මැවිල්ල සම්බන්ධයෙන් මිනිසාට පැවරූ වගකීම් 02 ක් ලියන්න. (ල. 02)

ii. දේව මැවිල්ල පිළිබඳව කියවෙන ගීතිකාවක ආරම්භක පද පේළි 04 ක් ලියන්න. (ල. 03)

iii. මිනිසාට අවශ්‍ය සියලුම දේ මවා දුන් දෙවි පියාට ස්තුති ප්‍රශංසා කර කුඩා යාච්ඤාවක් නිර්මාණය කරන්න. (ල. 05)

07 i. ශුද්ධ බයිබලය පරිහරණය කිරීමේදී සැළකිය යුතු කරුණු 02 ක් ලියන්න. (ල. 02)

ii. පංච පුස්තකයට අයත් පොත් 03 ක් නම් කරන්න. (ල. 03)

iii. උත්පත්ති පොතේ අඩංගු කරුණු 05 ක් කෙටියෙන් ලියන්න. (ල. 05)

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 06 - 2023

## කතෝලික ධර්මය

පිළිතුරු පත්‍රය

I කොටස

| | | | |
|---|---|---|---|
| 01. 3 | 06. 1 | 11. × | 16. මෝසෙස් |
| 02. 2 | 07. 2 | 12. √ | 17. ස්තේපන් |
| 03. 3 | 08. 4 | 13. √ | 18. පූජාප්‍රසාදිතුමන්ලාට |
| 04. 1 | 09. 3 | 14. √ | 19. ආධ්‍යාත්මිකව |
| 05. 4 | 10. 2 | 15. × | 20. ප්‍රේම කිරීම |

II කොටස

01. i. 46 හා 27
ii. ව්‍යවස්ථාවලිය, මෝසෙස්ගේ ව්‍යවස්ථා නීතිය, මෝසෙස්ගේ නීතිය
iii. චිත්‍ර ශිල්පය, වෛද්‍ය ක්ෂේත්‍රය, ඉතිහාස ක්ෂේත්‍රය
iv. දවාල හා රාත්‍රිය
v. දූප්පත් එඬේරුන්, ශාස්ත්‍රවන්තයන්
vi. සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය, රෝගීන්ගේ ආලේපය
vii. ඉරු දිනය හා ණය මංගල්‍යය දිනයන් හි
viii. මහ බ්‍රහස්පතින්දා, අන්තිම රාත්‍රී භෝජන සංග්‍රහයේදී
ix. ශු. මතෙව් තුමා, ශු. ජොහාන් තුමා
x. දේව ස්වරූපය හා දේව සමානකම

02. i. හතරවන පනතේ සිට දහය දක්වා ඕනෑම පනත් 02 ක්
ii. ජේසුස් වහන්සේගේ දුක් විඳීම, මරණය හා උත්ථානයයි.
iii. නියමිත කරුණුවලට අදාළව යාච්ඤාව ලියා ඇති ආකාරය අනුව ලකුණු ලබාදෙන්න.

03. i. සෑම ඉරු දිනක්ම/ පාරිශුද්ධ දේව මාතාවන්ගේ මංගල්‍යය - ජනවාරි 01
අගෝස්තු 15 - මරියෝත්තමාවන්ගේ ස්වර්ගාරෝපණ මංගල්‍යය
දෙසැම්බර් 08 - දෙව් මවුන්ගේ නිර්මල පිළිසිඳීමේ මංගල්‍යය
දෙසැම්බර් 25 - නත්තල් මංගල්‍යයය
ii. දස පනතේ පළමු පනත් තුන
iii. රෝගී වූවන් බැලීමට යාම, අසරණයන්ට පිහිටවීම, දිව්‍ය පූජාවට සහභාගි වීම, දහම් පාසලට සහභාගි වීම, සමිති සමාගම් වලට සම්බන්ධ වීම, යාච්ඤා කිරීම.

04. i. බරපතළ ලෙස ශාරීරිකව රෝගී වී සිටින විට
බරපතළ ශල්‍ය කර්මයකට පෙර
වයස්ගත දුර්වල වී සිටින විට
මරණාසන්න මොහොතක
බරපතල අනතුරකට පසුව
ii. ශුද්ධවූ සභාව සමග සමඟි වීම./ ආධ්‍යාත්මිකව ශක්තිමත් වීම.
සදාතන දඬුවමින් මිදීම.
දෙවියන් වහන්සේ හා සමඟි වීම.
යම් ප්‍රමාණයකට කාලීන දඬුවමින් මිදීම.
iii. පියතුමාව දැනුවත් කර රෝගීන්ගේ ආලේපය ලබා දීම.
රෝගියා වෙනුවෙන් යාච්ඤා කිරීම.
රෝගියාගේ සිතට සහනයක් දැනෙන ලෙස කතාබස් කිරීම.
රෝගියාට අවශ්‍ය ආහාරපාන සකසා දීම.
නියමිත පරිදි ප්‍රතිකාර කරවීම. ආදී ගැලපෙන පිළිතුරු වලට ලකුණු ලබා දෙන්න

05. i. අන්‍ය භාෂා කතා කිරීමේ ශක්තිය
එඩිතරව ඉදිරිපත්වීමේ හැකියාව
ii. ප්‍රසාද ස්නාපනය, අභිවෘද්ධි ආලේපය, පූජකවරය
iii. දේව දරුකම
ශු. සභාවේ සාමාජිකත්වය
ජන්ම හා කර්ම පාප කමා කරනු ලැබීම.
සුරලොවේ හිමිකරුවෙකු වීම.
අනෙකුත් දේව ප්‍රසාද නිධාන ලැබීමට සුදුස්සකු වීම.
කර්ම පාපයට නියමිත දඬුවම් මකා දැමීම.

06. i. දරු සම්පත් ලැබීමට/ පොළොව පුරා පැතිර යාමට
සතුන් රැකබලා ගනිමින් වර්ධනය කරමින් මානව අවශ්‍යතා සඳහා යොදාගැනීමට
පොළොව වගා කිරීමට ආදී පිළිතුරු සළකා බලා ලකුණු දෙන්න.
ii. දේව මැවිල්ල ගැන කියවෙන ඕනෑම ගීතිකාවක ට අදාළ ලකුණු ලබා දෙන්න.
iii. ප්‍රශ්නයේ දැක්වෙන අදහසට අනුව යාච්ඤාව ලියා ඇති ආකාරයෙන් සලකා බලා ලකුණු දෙන්න.

07. i. පිරිසිදු ස්ථානයක තැබීම.
මල් පහන් පූජා කිරීම.
සුදු රෙදි කඩක් මත තැබීම.
නිතර නිතර කියවා මෙනෙහි කිරීම.
අපිරිසිදු දෑතින් නොඇල්ලීම ආදී ගැන ගැලපෙන පිළිතුර සඳහා ලකුණු ලබා දෙන්න.
ii. උත්පත්ති, නික්මයාම, ලෙවී ව්‍යවස්ථාව, ගණන් කතාව, ද්විතීය නීති සංග්‍රහය යන පහෙන් ඕනෑම පිළිතුරු තුනක් සඳහා ලකුණු ලබා දෙන්න.
iii. මිනිසා මැවීම
ආදම් හා ඒව පාපයට වැටීම
කායින් හා ආබෙල් කතා පුවත
නෝවා හා ජල ගැල්ම
මිනිසා ඉදිකළ බාබෙල් කොත
ආදි පියවරුන්ගේ විශ්වාසනීය බව යනාදි පිළිතුරු.